# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2088/52 - 2018 සැප්තැම්බර් මස 12 වැනි බදාදා - 2018.09.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:-* BKP/LAND/ACQUI / A3/ 22.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය :* 4-3/ 15 /2016/වීර්/317.

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2016 නාය යාමෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම යටිදැරිය වත්ත - රංගල්ල ලප්පාන කොටස නැමැති ඉඩම අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි අත්පත් කරගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කරගැනීමේ පනතේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රංගල්ල ගම ග්‍රාම නිළධාරි වසමේ රංගල්ලගම තුළ පිහිටි කෑගල්ල මැනුම් අධිකාරියේ අංක මු.පි.කෑ. 3582 දරන මූලික පිඹුරේ අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි 3 (1, 2, 3) ක් වේ.

01. **කැබලි අංක 1, 2, 3**

ඉඩමේ නම:යටිදැරිය වත්ත - රංගල්ල ලප්පාන කොටස;හිමිකම් කියන අය:01. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල. 02. කළමනාකරණ අධ්‍යක්ෂ, කැගලු වැවිලි සමාගම, අංක 310, හයිලෙවල් පාර, මහරගම. 03. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, දෙවන මහල, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල.; ප්‍රමාණය: හෙක්. 4.0516.

වන්දි හිමිකම් පරීක්ෂණ දින:-

මු.පි.කෑ. 3582 පිඹුරේ කැ. අංක 03 සඳහා **2018.10.30** වැනි දින **පෙ.ව. 10.00 ට**

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලය පැවරුණු අයවලුන් හෝ ඉහත සඳහන්


1A - G 28519- 22 (2018/09)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

දිනයන්හි හා වේලාවන්හිදී බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2018 ඔක්තෝබර් මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම අත්පත් කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල ගණනය කළ ආකාරයත් පිටපත් දෙකක් සහිත ලියවිල්ලක් මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

ජේ. එම්. රම්‍යා ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
බුලත්කොහුපිටිය.

2018 සැප්තැම්බර් මස 05 වැනි දින,
බුලත්කොහුපිටිය,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 762

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.